# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2282/19 - 2022 මැයි මස 31 වැනි අඟහරුවාදා - 2022.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 6/77 (II)

**1977 අංක 8 දරන උද්‍ර්පණ නීතිය**

3 වගන්තිය යටතේ නියමය

1977 අංක 8 දරන උද්‍ර්පණ නීතියෙහි 3(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ වන මම, මෙම නියමය මඟින් පහත සඳහන් ලෙස, එනම්, විමර්ශනයට හෝ අපරාධ නඩු පැවරීමට යටත් පුද්ගලයන් සහ දඬුවම් නියම වූ තැනැත්තන් හුවමාරු කිරීම පාලනය කරනු ලබන සහ හසුරුවනු ලබන ද්වීපාර්ශ්වික යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා සහ අපරාධ වැළැක්වීම සහ එම අපරාධ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමෙහි ලා තත් ගිවිසුමේ රාජ්‍ය පාර්ශ්වයන් අතර සහයෝගය වර්ධනය වන අයුරින් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ද සඳහා 2014 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ විදේශීය රාජ්‍යයක් වන එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර අබුඩාබිහි දී උද්‍ර්පණ ගිවිසුමක් අත්සන් කළ බැවින් ද, එක් රාජ්‍ය පාර්ශ්වයක් අනෙක් රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලීමක් කරන ලද විට හා ගිවිසුමේ වගන්තිවලට යටත්ව දඬුවම් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අදාළ පාර්ශ්වයන්ගේ දේශසීමා තුළ දී සොයාගන්නා ලද විමර්ශනයට හෝ අපරාධ නඩු පැවරීමට යටත් පුද්ගලයන් සහ දඬුවම් නියම වූ තැනැත්තන්, අනෙක් පාර්ශ්වය වෙත උද්‍ර්පණය කිරීමට බැඳී සිටින බැවින් ද, ඉහත කී ගිවිසුමේ වගන්ති 1977 අංක 8 දරන උද්‍ර්පණ නීතියේ 4 වන වගන්තිය සමග අනුකූලවන බැවින් ද එකී ගිවිසුමේ සඳහන් යම් සංශෝධනයකට, සීමා කිරීමකට හෝ කොන්දේසියකට යටත්ව එකී 1977 අංක 8 දරන නීතියෙහි වගන්තීන් එකී විදේශීය රාජ්‍යය කෙරෙහි අදාළ වන බව ප්‍රකාශ කරමි.

**ගෝඨාභය රාජපක්‍ෂ,**
ජනාධිපති.

2022 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 05-0162